ක්‍රියාකාරකම: වනයේ සැරිසරන සතුන්

ඉගෙනුම් ඵල:

- සතුන්ට ආදරය, කරුණාව දක්වයි.
- සතුන්ට හිංසා පීඩා නොකරයි.
- වනයේ සිටින සතුන් හඳුනා ගනියි.

උපදෙස්:

- දුවේ පුතේ, මේ කාලයේ නිවසේ සිටින නිසා ඔබ අවට පරිසරය පිළිබඳව තොරතුරු නිරීක්ෂණය කරන්න.
- රූපවාහිනියෙන්, වැඩිහිටියන්ගෙන් වනයේ සිටින සතුන් පිළිබඳව තොරතුරු අසා දැන ගන්න.
- ඔබ නිවස අසල කැළෑවල්, වනරොදවල් තිබේනම් වැඩිහිටියන් සමඟ පරිසරයේ සිරි නරඹන්න.
  උදා: කුරුල්ලෝ, දඬුලේනා, මුගටියා, වළිකුකුළා, කඹරගොයා, වඳුරා, රිලවා ආදී සතුන් වැඩි වශයෙන් දැක ගත හැකිවෙයි.
- මීට අමතරව වනයේ සිටිය හැකි සතුන්ගේ පින්තූර බලන්න.
- සතුන්ගේ හැඩ, විවිධ ඉරියව් හොඳින් නිරීක්ෂණය කරන්න.
  උදා: වලිගය, පාද පිහිටා ඇති ආකාරය, නිදාගෙන සිටින ඉරියව්
- පහත සඳහන් පින්තූර හොඳින් බලන්න. ඇඳීමට හුරුවන්න.
- පාසල් ආරම්භයෙන් පසු ගුරුතුමාට/ගුරුතුමියට පෙන්වා උපදෙස් ලබාගන්න.